JMC vLearning
"your virtual learning partner"

# ව්‍යාපාර කෙරෙහි රජයේ බලපෑම්, ව්‍යාපාරයකට ව්‍යාපාර ආචාරධර්ම හා සමාජයීය වගකීම්වල ඇති වැදගත්කම

## AAT අදියර I
BEN - ව්‍යාපාර පරිසරය

තරංග ජයනන්ද
B.Sc. (Business Administration) Sp. (USJP)

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

JMC vLearning
"your virtual learning partner"

# ව්‍යාපාර කෙරෙහි රජයේ බලපෑම ව්‍යාපාර ආචාර ධර්මවල ඇති වැදගත්කම

තරංග ජයනන්ද

## රජය සහ ව්‍යාපාර අතර අන්තර් ක්‍රියාකාරිත්වය

ඕනෑම රටක ආර්ථිකය මෙහෙයවන ප්‍රධාන කාරකය වන්නේ එරට රජයයි

ව්‍යාපාර සංවර්ධනය හා පාලනය සම්බන්ධව රජය විවිධාකාරයෙන් බලපෑම් කරන අතර රජයේ ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපාරික ප්‍රජාව ද විවිධාකාරයෙන් දායක වේ.




## රජයක් විසින් ආර්ථිකය මෙහෙයවීමේ අරමුණු

- ආර්ථික වර්ධනය හා සංවර්ධනය
- පූර්ණ සේවා නියුක්තියක් බිහි කිරීම
- ආර්ථික ස්ථායිතාවය ඇති කිරීම
- සාධාරණ ආදායම් ව්‍යාප්තියක් බිහි කිරීම
- යහපත් අන්තර්ජාතික වෙළඳාමක් පවත්වා ගෙන යාම
- තිරසර සංවර්ධනය.

©JMC vLearning

## ආර්ථික වර්ධනය හා සංවර්ධනය

ආර්ථික වර්ධනය හෙවත් ආර්ථික වෘද්ධිය යනුවෙන් අදහස් කරන්නේ රටක මූර්ත ජාතික ආදායම වසර ගණනක සිට දිගු කාලීන ව අඛණ්ඩව ඉහළ යාම හෙවත් වර්ධනයයි.

ආර්ථික සංවර්ධනය යනු ආර්ථික වර්ධනය තුළින් ඇති වන ප්‍රතිලාභ රටේ සමස්ත ජනතාව වෙත බෙදී ගොස් ඔවුන්ගේ ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීමේ ක්‍රියාවලියයි එනම් සංවර්ධනයේ දී තිරසාර ආර්ථික වෘද්ධියත් සමග එහි ප්‍රතිලාභ ඉහළ සිට පහළට සමස්ත ජනතාව වෙතම ගලා ගොස් ඔවුන්ගේ දිළිඳුකම, විරැකියාව හා ආදායම් විෂමතා ඉවත් වී මිනිස් ජීවිතවල ගුණාත්මක තත්ත්වය ඉහළ යාමක් සිදු විය යුතු ය

## පූර්ණ සේවා නියුක්තිය

රටක් සතු සියලුම සම්පත් නිෂ්පාදනය සඳහා යොදවා ඇති තත්ත්වයක් පූර්ණ සේවා නියුක්තිය ලෙස හඳුන්වා දිය හැකිය. සේවා වියුක්තිය අවම කොට ඉහළ සේවා නියුක්තියක් අත්පත් කර ගැනීම තුළින් පූර්ණ සේවා නියුක්තියක් බිහි කර ගැනීම රජයේ අරමුණකි. මේ සඳහා ව්‍යාපාර වැදගත් කාර්යයභාරයක් ඉටු කරයි

©JMC vLearning

## ආර්ථික ස්ථායිතාවය

රටක ආර්ථිකය උච්චාවචනයකින් තොරව පවත්වා ගෙන යෑම සහ වර්ධනය කිරීම මෙහි අදහසයි

රටේ සාමාන්‍ය මිල මට්ටම ස්ථාවරව පවත්වා ගැනීම හෙවත් මිල ස්ථායිතාව, සේවා නියුක්ති ස්ථාවරභාවය හා ගෙවුම් ශේෂ ස්ථාවරභාවය යන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමෙන් ආර්ථික ස්ථායිතාව හෙවත් ආර්ථික ස්ථාවරභාවය රටකට අත්පත් කර ගත හැකිය

## සාධාරණ ආදායම් ව්‍යාප්තිය

ආදායම් විෂමතාව වැඩි වීම නිසා සාධාරණත්වය යන ආර්ථික ගැටලු අවම කිරීම සඳහා රජයන් විසින් ආදායම් සඳහා ව්‍යාපාර කෙරෙහි සෘජු මෙන්ම වක්‍රව බලපෑම් රාශියක් සිදුකරනු ලබයි. බදු පැනවීම මෙන්ම සුබසාධන කටයුතු ක්‍රියාත්මක කිරීම රජයක් සිදුකරන්නේ සාධාරණතාවය රැකීම ද වෙනුවෙනි

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

යහපත් අන්තර්ජාතික වෙළඳාමක් පවත්වා ගෙන යාම

රටක් බාහිර ලෝකය සමඟ සිදු කරනු ලබන සියළුම වෙළෙඳ කටයුතු රටේ සංවර්ධනයට හිතකර ලෙස පවත්වා ගෙන යාම රජයේ අපේක්ෂාවයි. මෙහි දී විශේෂයෙන්ම ගෙවුම් ශේෂ ස්ථාවරභාවය පිළිබඳව අවධානය යොමු කරන අතර මෙමගින් යහපත් අන්තර්ජාතික වෙළෙඳාමකට මඟ පෑදේ

තිරසර සංවර්ධනය

අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීමේ ඇති අයිතිය උල්ලංඝනය නොකරමින් වර්තමාන අවශ්‍යතා ලඟාකර ගන්නා සංවර්ධනයයි.

තිරසාර සංවර්ධනය ගොඩනැගී ඇති ප්‍රධාන කුළුණු

- ආර්ථික තිරසාර සංවර්ධනය
- පරිසර තිරසාර ආරක්ෂණය
- සමාජ තිරසාර සංවර්ධනය.

©JMC vLearning

## රජයේ අරමුණු ඉටු කර ගැනීමට ව්‍යාපාර දායක වන ආකාරය

1. නිසි පරිදි බදු ගෙවීම
   - සිය ව්‍යාපාර කටයුතු වලින් උපයනු ලබන ලාභ මත රජයට ගෙවිය යුතු බදු නිසි පරිදි කලට වේලාවට ගෙවීමයි
2. දේශීය සම්පත් භාවිතා කිරීම
   - සිය ව්‍යාපාර කටයුතු සඳහා හැකිතාක් දුරට දේශීය සම්පත් උපයෝජනය කර ගැනීමයි
3. රජයේ නීති රීති හා ප්‍රතිපත්ති වලට අනුකූලව කටයුතු කිරීම
   - රජය විසින් පනවා ඇති නීති රීති හා ප්‍රතිපත්ති වලට අනුකූලව සිය ව්‍යාපාර කටයුතු කිරීමයි
4. රැකියා අවස්ථා සැපයීම
   - දේශීය ශ්‍රමිකයන් සිය ව්‍යාපාර කටයුතු වලට යොදා ගැනීමයි. එසේ කිරීමෙන් රැකියා හිඟය පියවා ගැනීමට දායක විය හැකිය

©JMC vLearning

5. පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම

- පරිසර දූෂණය සිදු නොවන පරිදි ව්‍යාපාර කටයුතු පවත්වා ගැනීමයි. ව්‍යාපාර කටයුතු තුලින් පරිසරයට සිදුවිය හැකි හානි පාලනයට ව්‍යාපාරිකයා හැකි පමණ උනන්දු විය යුතුය

6. විදේශ විනිමය ඉපයීම

- විදේශ වෙළඳපොළ සඳහා භාණ්ඩ හා සේවා ඉදිරිපත් කිරීම තුළින් විනිමය ඉපැයීමයි

## රජය සහ ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය සහ එහි වැදගත්කම

**රජය** → පෞද්ගලික අංශය වෙත රජය විසින් යටිතල පහසුකම්, බදු සහන මූල්‍ය, තාක්ෂණික. අලෙවි පහසුකම් යනාදී විවිධ පහසුකම් සපයා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට යෝග්‍ය පරිසරයක් ඇතිකල යුතුය. එය රජයේ වගකීමද වේ.

©JMC vLearning

**ව්‍යාපාර** → ව්‍යාපාර රජයේ සහයෝගය ඇතිව ව්‍යාපාර වර්ධනය, වෙළඳපොළ කොටස පුළුල් කර ගැනීම, ලාභය ඉහළ නංවා ගැනීම යනාදී ව්‍යාපාරික අරමුණු ඉටු කර ගැනීම පහසු වීම නිසා පෙරලා ව්‍යාපාර විසින් නිසි පරිදි බදු ගෙවීම, රජයේ ආර්ථික ප්‍රතිපත්ති හා නීතිරීති වලට ගරු කරමින් කටයුතු කිරීම, රැකියා අවස්ථා සැපයීම, දේශීය සම්පත් භාවිතය, පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම යනාදී වගකීම් ඉටුකල යුතුය.

**වැදගත්කම**

රජය ව්‍යාපාරවලට අවශ්‍ය පහසුකම් සැපයීම තුලින් ව්‍යාපාර දිරිමත්වන අතරම ව්‍යාපාර සංවර්ධනය තුළින් රජයේ අරමුණු ඉටු වීමත් සිදු වේ. මේ නිසා සමස්ථ ආර්ථිකයේ වර්ධනයට රජය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වැදගත් වේ.

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## රජයක විවිධ අරමුණු

- ආර්ථික කටයුතු කළමනාකරණය කිරීම
- සමාජීය ප්‍රාග්ධනය සඳහා සම්පත් සැපයීම
- රැකියා විරහිත අයට, පහළ මට්ටමේ ආදායම් ලබන්නන්ට, විශ්‍රාමිකයින්ට සුබසාධන පහසුකම් සැපයීම
- වෙළෙඳපොළ ඒකාධිකාරී තත්ත්වයන් පාලනය කොට තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම
- පෞද්ගලික අංශය නො සපයන පොදු හා සුබසාධන භාණ්ඩ සැපයීම
- පරිසරය සුරැකීම සඳහා කටයුතු කිරීම
- අසාධාරණ තරග හා වෙළෙඳ විෂමාචාර වැනි දේවලින් පාරිභෝගිකයන් මෙන්ම ව්‍යාපාරිකයින් ද බේරා ගැනීම
- ධනය සහ ආදායම සාධාරණ ව බෙදා හැරීම හෙවත් ආදායම් විෂමතාව අඩු කිරීම
- පුද්ගලයෙකුට ඇති තෝරා ගැනීමේ නිදහස තහවුරු කිරීම.

©JMC vLearning

## රජය ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන ආකාරය

ශ්‍රී ලංකාවේ පවත්නා මිශ්‍ර අර්ථ ක්‍රමය තුළ රජය විසින් කරනු ලබන බලපෑම් රාශියක් දැකිය හැකිය. එම බලපෑම් මධ්‍යම රජයේ ප්‍රතිපත්ති, නීති රීති හා රෙගුලාසි මඟින් ද පළාත් සභා ප්‍රතිපත්ති, නීතිරීති හා රෙගුලාසි මඟින් ද, පළාත් පාලන ආයතන ප්‍රතිපත්ති හා නීතිරීති මඟින් ද සිදුවේ

ඒ අතුරින් ප්‍රධාන බලපෑම් කිහිපයක් පහත පරිදි වේ.

1. යටිතල පහසුකම් සහ අත්‍යාවශ්‍ය සේවා සැපයීම මඟින් බලපෑම් කිරීම
   - රජය විසින් යටිතල පහසුකම් සංවර්ධනය තුළින් කරනු ලබන දිරිගැන්වීමයි ප්‍රවාහනය, විදුලිය, සන්නිවේදනය, වරාය, ගුවන්තොටුපොල, මහා මාර්ග, ජලය, අප ද්‍රව්‍ය බැහැර කිරීම වැනි යටිතල පහසුකම් සැපයීම තුලින් සහ අධ්‍යාපනය, ආරක්ෂාව, සනීපාරක්ෂාව, තැපැල් වැනි අත්‍යාවශ්‍ය සේවා සැපයීම තුළින් ව්‍යාපාර කෙරෙහි රජය බලපෑම් කරයි

©JMC vLearning

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

2. බදු අයකරන නියෝජිතයකු ලෙස රජය ව්‍යාපාරවලට කෙරෙන බලපෑම

- රජයක් විසින් ව්‍යාපාර වලින් විවිධ බදු අය කරමින් ව්‍යාපාර කෙරෙහි බලපෑම් සිදු කරයි- එකතු කළ අගය මත බදු (VAT), පුද්ගලික ආදායම් බදු, නිෂ්පාදන බදු (සුරාබදු), ව්‍යාපාර ලාභ මත බදු, ලාභාංශ බදු, තීරු බදු හා මෝටර් රථ ලියාපදිංචි බදු මේ සඳහා උදාහරණ වේ

බදු අය කිරීම සඳහා පිහිටුවා ඇති ආයතන

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- සුරා බදු දෙපාර්තමේන්තුව
- රේගු දෙපාර්තමේන්තුව
- මෝටර් රථවාහන දෙපාර්තමේන්තුව.

©JMC vLearning

3. ප්‍රතිපත්ති සම්පාදකයෙකු ලෙස රජය ව්‍යාපාරවලට කරන බලපෑම

- රජයක මූලිකම අරමුණ වන රටේ ආර්ථික සංවර්ධනයක් බිහි කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයෙකු ලෙස මූල්‍ය ප්‍රතිපත්තිය සහ පිස්කල් ප්‍රතිපත්තිය ඇතුළු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබයි

4. නීති රීති පැනවීම මඟින්/ නියාමකයකු වශයෙන් බලපෑම් කිරීම

- අණ පනත් සම්මත කර ගැනීමෙන් හා රටේ සමස්ත ව්‍යාපාර කටයුතු අධීක්ෂණය තුළින් රජය කරන බලපෑමයි. රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, කොමිෂන් සභා වැනි ආයතන මේ සඳහා ස්ථාපිත කර ඇත.
  උදාහරණ:
  පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික ගමනා ගමන කොමිසම, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, සමාගම් රෙජිස්ටාර් කාර්යාලය, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම, ශ්‍රී ලංකා මහ බැංකුව

©JMC vLearning

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd 

5. තරඟකරුවෙකු ලෙස බලපෑම් කිරීම

- තරඟකාරී ව්‍යාපාර ඇරඹීම මඟින් ව්‍යාපාර කෙරෙහි රජය ඇති කරන බලපෑමයි රාජ්‍ය සංස්ථා, රාජ්‍ය සමාගම්, රාජ්‍ය දෙපාර්තමේන්තු මෙන්ම පළාත් සභා මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා හරහා පෞද්ගලික අංශයේ ව්‍යාපාර සමඟ රජය ද තරඟකරුවකු ලෙස ව්‍යාපාර කටයුතු වල යෙදී සිටී. ප්‍රවාහන, රූපවාහිනී, ගුවන් විදුලි, ප්‍රවෘත්ති පත්‍ර, අධ්‍යාපන, සෞඛ්‍ය, බැංකු, දුරකථන යනා දී ක්ෂේත්‍ර වලදී මෙය කැපී පෙනේ

6. දිරි ගැන්වීම් සපයන්නෙකු ලෙස බලපෑම් කිරීම

- මූල්‍ය, තාක්ෂණික, අලෙවි, උපදේශන, පර්යේෂණ හා සංවර්ධන පහසුකම් වැනි දිරි ගැන්වීම් තුළින් රජය කරනු ලබන බලපෑමයි. ඇතැම් රාජය ආයතන තාක්ෂණය හෙවත් ශිල්පීය දැනුම ලබා දීම, කළමනාකරණ උපදේශන සේවා ලබාදීම, සේවක පුහුණු කිරීම්, වෙළඳපොළ පහසුකම් සැලසීම, මඟින් පෞද්ගලික අංශයේ ව්‍යාපාර දිරිමත් කරනු ලබයි

උදාහරණ:

©JMC vLearning

- මූල්‍ය පහසුකම් සැපයීම
- බදු විරාම, බදුසහන, බදු ප්‍රතිදාන බදු නිදහස් කිරීම
- ජාත්‍යන්තර ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම
- ශිල්පීය දැනුම හා තාක්ෂණය ලබා දීම
- වෙළෙඳපොළ පහසුකම් ලබා දීම
- කළමනාකරණ උපදේශන සේවා ලබා දීම
- සේවකයින් පුහුණු කිරීමේ පහසුකම් ලබා දීම.

6. ගනුදෙනුකරුවකු වශයෙන් බලපෑම් කිරීම

- රජය විසින් නිෂ්පාදිත මිලට ගැනීමෙන් කරන බලපෑමයි. පෞද්ගලික අංශයේ ව්‍යාපාර වලින් විවිධ වූ භාණ්ඩ හා සේවා රැසක් රජය විසින් මිලට ගනී

උදාහරණ:

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- රාජ්‍ය කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය වන කාර්යාලීය උපකරණ හා ද්‍රව්‍ය, ගොඩනැගිලි, පරිගණක උපකරණ යනාදිය මිලදී ගැනීම
- අවි ආයුධ ආදී හමුදාවන්ට අවශ්‍ය විවිධ දෑ මිලදී ගැනීම
- කළමනාකරණ උපදේශන සේවා, ඉංජිනේරු සේවා, ප්‍රවාහන සේවා, සන්නිවේදන සේවා, විදුලි බලය යනාදී විවිධ වර්ගයේ භාණ්ඩ හා සේවා විශාල ප්‍රමාණයක් ව්‍යාපාර ආයතන වලින් රජය නිරන්තරයෙන් මිලදී ගනී.

## ව්‍යාපාර සංවර්ධනය ඇති කිරීම සඳහා රජය ලබා දෙන මූල්‍ය පහසුකම්

රාජ්‍ය බැංකු හා වෙනත් රාජ්‍ය මූල්‍ය ආයතන විසින් ව්‍යාපාරිකයින්ට සහනදායී කොන්දේසි යටතේ ලබා දෙන ණය මුදල් මින් අදහස් වේ.

රජය මූල්‍ය පහසුකම් සැපයීමේ අරමුණ

විවිධ ආයෝජන කටයුතුවල නිරත කරවීම හා පෙළඹවීම පිණිස සඳහා ඔවුන්ට අවශ්‍ය ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍යතා හා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට ඉඩ සැලසීම වේ.

©JMC vLearning

## මූල්‍ය පහසුකම් සපයන ආයතන

- ජාතික සංවර්ධන බැංකුව
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව බැංකුව
- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
- ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව
- ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු
- ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව.

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## මූල්‍ය පහසුකම් සැපයීමේදී යොදා ගන්නා උපාය මාර්ග

- ප්‍රතිමූල්‍ය පහසුකම්
- සරල කොන්දේසි යටතේ ණය ලබාදීම
- කල්බදු ක්‍රම හඳුන්වා දීම
- විනිමය නීති ලිහිල් කිරීම
- අපනයන දිරිගැන්වීමේ යෝජනා ක්‍රම
- අපනයන ණය සහතික කිරීමේ යෝජනා ක්‍රම.

## මූල්‍ය පහසුකම් සපයන විවිධ ක්ෂේත්‍ර

- කෘෂිකාර්මික ණය
- ගොඩනැගිලි ඉදිකිරීම හා අලුත්වැඩියාව සඳහා ණය
- කාර්මික ණය
- ආනයන අපනයන ණය
- වෙළෙඳ ණය
- කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා.

©JMC vLearning

## මූල්‍ය පහසුකම්වලට අතිරේකව ව්‍යාපාරිකයින්ට රජය මගින් ලබාදෙන අනුග්‍රහයන්

1. ව්‍යාපාර සඳහා උපදෙස් හා පුහුණුව ලබාදීම

රජයේ විවිධ දෙපාර්තමේන්තු හා වෙනත් රාජ්‍ය ආයතන මගින් නිෂ්පාදන, තාක්ෂණ, ගුණත්ව පාලනය, ව්‍යාපාර සැලසුම්කරණය, ව්‍යාපාර මූල්‍යනය හා අලෙවිකරණය ඇතුළු විවිධ ක්ෂේත්‍ර සඳහා උපදෙස් ලබා දීම සිදු කරයි

ව්‍යාපාර සඳහා උපදෙස් හා පුහුණුව ලබා දෙන ආයතන

- ➢ කාර්මික සංවර්ධන මණ්ඩලය
- ➢ කාර්මික තාක්ෂණික ආයතනය
- ➢ ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය
- ➢ අපනයන සංවර්ධන මණ්ඩලය
- ➢ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
- ➢ ජාතික මෝස්තර මධ්‍යස්ථානය
- ➢ ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු කිරීමේ අධිකාරය.

©JMC vLearning

2. ව්‍යාපාර සඳහා තොරතුරු සැපයීම

රජය ව්‍යාපාරවලට අවශ්‍ය වන තොරතුරු විශාල ප්‍රමාණයක් ලබා දීම සඳහා ක්‍රම හා ආයතන පද්ධතියක් හඳුන්වා දී ඇත

- ජනලේඛන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව
- අපනයන සංවර්ධන මණ්ඩලය
- වාණිජ දෙපාර්තමේන්තුව වැනි ආයතන.

3. විනිමය පහසුකම් සැපයීම

ව්‍යාපාරික අවශ්‍යතා සඳහා විදේශිය මුදල් මිලදී ගැනීමේ පහසුකම් සැපයීම වේ

විනිමය ගනුදෙනු සම්බන්ධ අවහිරතා අවම කිරීම, විදේශ විනිමය ගිණුම් ආරම්භ කිරීමට අවසර ලබා දීම ආදිය මෙහිදී දැක්විය හැක.

©JMC vLearning

# රාජ්‍ය ආයතන මගින් ලබාදෙන විවිධ පහසුකම්

ශ්‍රී ලංකා ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථානය

- ❑ පුහුණුව හා මඟ පෙන්වීම මඟින් කළමනාකාරීත්ව දක්‍ෂතා දියුණු කිරීම
- ❑ ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය වඩාත් ඵලදායී ලෙස සැලසුම් කොට ව්‍යාපාරික කටයුතු කිරීම වෙනුවෙන් අවශ්‍ය පසුබිම සකස් කිරීම
- ❑ මූලික වශයෙන් ව්‍යවසායකත්වය දියුණු කිරීම.

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

- නව මෝස්තර පිළිබඳ තරග සංවිධානය
- විවිධ වෘත්තීන් සඳහා පුහුණු සේවකයින් අනුයුක්ත කිරීම තුළින් රැකියා අවස්ථා ඇති කිරීම
- වෘත්තීන් පිළිබඳ සේවා ප්‍රමිති සකස් කිරීම.

©JMC vLearning

ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය

- ❑ නව ඇසුරුම් ක්‍රම හඳුන්වා දීම
- ❑ ඇසුරුම්කරණයේ බාධක හඳුනා ගෙන විසඳුම් ලබා දීම
- ❑ ඇසුරුම් ක්‍රම පිළිබඳ පාඨමාලා සංවිධානය කිරීම.

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

- කළමනාකාරීත්ව සංවර්ධනය යටතේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කළමනාකරුවන් හා ඊට සම්බන්ධ අධීක්ෂණ අංශයේ නිලධාරීන් පුහුණු කිරීම
- කළමනාකාරීත්ව පර්යේෂණ සිදු කිරීම යටතේ අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ හා දත්ත රැස්කිරීම
- පරිගණක සේවා යටතේ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම හා විවිධ ආයතනවලට කොන්ත්‍රාත් ක්‍රමය යටතේ පරිගණක වැඩසටහන් සකස් කර දීම.

©JMC vLearning

කාර්මික තාක්ෂණ ආයතනය

- ❑ කර්මාන්ත සඳහා තාක්ෂණික උපදේශන සේවා සැපයීම
- ❑ කාර්මික සේවක පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ❑ තොරතුරු මධ්‍යස්ථාන හරහා කාර්මික ඥාණය බෙදාහැරීම .

## ව්‍යාපාර ලියාපදිංචියට ඉඩ සැලසීම නිසා ඇති වන වාසි

- ව්‍යාපාරයේ කීර්තිනාමය වර්ධනයට හේතුවීම
- රටේ සංවර්ධනයට දායක වීමට අවස්ථාව හිමිවීම
- රජයේ ඉහළ පිළිගැනීමකට ලක්වීම
- මහජනයා අතර පිළිගැනීමට ලක්වීම.

©JMC vLearning

## ව්‍යාපාර ආචාර ධර්ම

ව්‍යාපාරයක් තම කටයුතු කරගෙන යාමේ දී තමාටත්, සෙසු පාර්ශවයන්ටත් හා පුළුල් වශයෙන් මුළු මහත් සමාජයටත් යහපතක් සැලසෙන පරිදි කටයුතු කිරීමයි

නැතහොත්,

හොඳ නරක පිළිබඳ මනා වැටහීමකින් තම ව්‍යාපාරික කටයුතු සිදු කිරීමයි.

ව්‍යාපාර ආචාර ධර්ම මඟින් අවධාරණය කරනු ලබන කරුණු

❖ පවතින නීති රීති අනුගමනය කරන බව

❖ සාධාරණව හා අවංකව කටයුතු කරන බව

❖ සත්‍යවාදී බව හා අන් අයට හානි නොකිරීම.

©JMC vLearning

## ආචාර ධර්ම සංග්‍රහ (Code of Ethics)

ව්‍යාපාරයක සේවකයින් විසින් අනුගමනය කලයුතු ආචාරධර්මානුකූලව හැසිරීමට අදාළ වූ ආචාර ධර්ම ඇතුලත් ලිඛිත සංග්‍රහයකි.

ආචාර ධර්ම සංග්‍රහයක වැදගත්කම

❖ සේවකයින් විසින් ආචාර ධර්ම වලට අනුකූලව කටයුතු කිරීමට පෙළඹීම

❖ සේවක ඵලදායිතාවය ඉහළ යාම හා ශ්‍රම පිරිවැය පහළ යාමට හේතු වීම

❖ ආයතනයේ කීර්තිනාමය ඉහළ නැංවීමට හේතු වීම

❖ පෙර සිදු වූ යල්පැන ගිය විෂමාචාර වැලකී යාම

❖ විවිධ ව්‍යාපාර ශ්‍රිතයන් සඳහා ආචාරධර්ම සංග්‍රහය පිළියෙල කිරීමට හැකි වීම.

©JMC vLearning

## ආචාර ධර්ම සංග්‍රහයක් පිළියෙළ කිරීමේ දී සැලකිය යුතු කරුණු

- තම ව්‍යාපාරයේ ස්වාභාවය
- ව්‍යාපාරයේ අයිතිකරුවන් කවුරුන්ද ඔවුන්ගේ ආකල්ප සංජානනයන් වටිනාකම් මොනවාද යන්න
- ව්‍යාපාරයේ සේවකන් කවුරුන්ද ඔවුන්ගේ ආකල්ප සංජානනයන් වටිනාකම් මොනවාද යන්න
- ගනුදෙනුකරුවන් පිළිබඳ සැළකිල්ල යොමු කිරීම
- තරඟකරුවන් පිළිබඳ සැළකිල්ල යොමු කිරීම
- ව්‍යාපාර සංස්කෘතියේ ස්වාභාවය
- ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකිද යන්න
- නෛතික එකඟතාවය
- පිරිවැය
- පැන නැඟිය හැකි ගැටළු මොනවාද යන්න.

©JMC vLearning

## ආචාර ධර්ම සංග්‍රහයක් මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ

- සේවකයින් එම ආචාර ධර්ම වලට අනුකූලව කටයුතු කිරීමට පෙළඹීම හා කාර්මික සම්බන්ධතා යහපත් වීම
- ව්‍යාපාරයේ මූල්‍ය කටයුතු කාර්යක්ෂම වීම
- පෙර සිදුවූ යල් පැනගිය විෂමාචාර වැලකී යාම
- විවිධ ව්‍යාපාර ශ්‍රිතයන් සඳහා ආචාර ධර්ම පිළියෙල කිරීමට හැකිවීම
- ව්‍යාපාරය පිලිබඳ ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය තහවුරු වීම
- තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකි වීම.

©JMC vLearning

## ව්‍යාපාර ශ්‍රිතයන්ට අනුව වෘත්තීය ආචාර ධර්ම

### මූල්‍ය කළමනාකරණයට අදාල ව්‍යාපාර ආචාර ධර්ම

මූල්‍ය ක්ෂේත්‍රය තුල සිදු විය හැකි විෂමාචාර පිටු දැකීම සඳහා උසස් ගුණාත්මකභාවයෙන් යුතුව මූල්‍ය කටයුතු පවත්වාගෙන යාම සඳහා මූල්‍ය අංශයට අදාලව ආචාර ධර්ම ගොඩ නැගේ

- ❖ ගිණුම්කරණ කටයුතුවල විනිවිදභාවය හෙවත් පාර දෘෂ්‍යභාවය
- ❖ බදු වංචා වලින් වැළැක්වීම
- ❖ ව්‍යාජ ලෙස තැම්පතු රැස් කිරීමෙන් වැළකීම
- ❖ තොග ප්‍රපාතනයෙන් වැළකීම
- ❖ අශෝභන ගිණුම්කරණ උපක්‍රම මඟින් ආයෝජන අයතා ලෙස පරිහරණය කිරීමෙන් වැළකීම
- ❖ අනවශ්‍ය වූ අධික ගෙවීම් හා වියදම් වලින් වැළකීම.

©JMC vLearning

### මානව සම්පත් කළමනාකරණයට අදාල ව්‍යාපාර ආචාර ධර්ම

කාර්මික සබඳතා හෙවත් සේවක සේව්‍ය සබඳතා ආශ්‍රිතව පැන නගින ගැටුම් හා අර්බුද අවම කිරීමටත් වළක්වාලීමටත් මානව සම්පත් කළමනාකරණයට අදාලව ආචාර ධර්ම ගොඩ නැගේ

- සේවකයින්ට සමානව සැලකීම/ ජාති ආගම් වැනි සාධක මත විෂම ලෙස නොසැළකීම
- සේවක යුතුකම් හා අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම
- සේවක හිංසනයෙන් වැළකීම
- වෘත්තීය අනාරක්ෂිත බව පිටුදැකීම
- වෘත්තීය සෞඛ්‍ය ආරක්‍ෂාව.

©JMC vLearning

## අලෙවි කළමනාකරණයට අදාල ව්‍යාපාර ආචාර ධර්ම

මිල උපාය මාර්ග, විකුණුම් ප්‍රවර්ධන උපාය මාර්ග. ප්‍රචාරණ උපාය මාර්ග තුළින් විෂමාචාර සිදු කිරීම අවම කිරීමට අලෙවිකරණ ආචාර ධර්ම ගොඩ නැගේ

- ගනුදෙනුකරු නොරැවටීම
- නැති ගුණ හුවා දක්වමින් වැරදි ප්‍රචාරණ නොකිරීම
- සාධාරණව හා අවංකව තරඟ කිරීම (තරඟ විරෝධී චර්යාවන් පිටුදැකීම)
- සමාජයට  වඩා හොඳින් සේවය කිරීම සඳහා අලෙවිකරණ දැනුම හා පරිචයන් වැඩි දියුණු කරන බවට සහතික වීම
- පාරිභෝගිකයාගේ තෝරාගැනීමේ නිදහස ආරක්ෂා කිරීම.

©JMC vLearning

## මෙහෙයුම් කළමනාකරණයට/ නිෂ්පාදනයටඅදාල ව්‍යාපාර ආචාර ධර්ම

ව්‍යාපාරික නිෂ්පාදන ක්‍රියාවලිය මෙන්ම නිෂ්පාදිත ද සමාජයට හා පරිසරයට අහිතකර බලපෑම් ඇති නොකරන බවට වග බලා ගැනීම අරමුණු කරමින් මෙහෙයුම් කළමනාකරණ ආචාර ධර්ම ගොඩ නැගේ

- පරිසර හිතකාමී නිෂ්පාදන බිහි කිරීම
- ස්වාධිකාර අයිතිය සොරා ගැනීමෙන් වැළකීම
- සමාජ විරෝධී අනතුරුදායක නිෂ්පාදිතයන්ගෙන් ඉවත් වීම (දුම් කොළ, මත්පැන්, මත් කුඩු, යුධ අවි)
- පරිසර දූෂණය ගෙන දෙන ව්‍යාපාර ක්‍රියාවලි පාලනය
- අස්වාභාවික ආහාර නිෂ්පාදනය නොකිරීම (ජාන තාක්ෂණික ආහාර).

©JMC vLearning

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## බුද්ධිමය දේපල හා සම්බන්ධ ආචාර ධර්ම

බුද්ධිමය දේපල

මිනිසා විසින් සිය බුද්ධිය දැනුම කුසලතාවයන් මෙහෙයවා කරනු ලබන නිර්මාණයන් වේ.

බුද්ධිමය දේපල අයිතිය

නිර්මාණය පිළිබඳව නිර්මාණකරුවකුට ඇති හිමිකම බුද්ධිමය දේපල අයිතිය ලෙස සැලකේ.

බුද්ධිමය දේපල ආරක්ෂා කිරීමේ දී ආචාර ධර්මවල අවශ්‍යතාවය

නව නිර්මාණ ගවේෂණය, නිර්මාණය, සංවර්ධනය වැනි අවස්ථාවල අදාළ වත්කමේ අයිතිය කාට හිමිවිය යුතු ද යන්න පිළිබඳ මතභේද ඇතිවන අවස්ථාවක දී බුද්ධිමය දේපළට අදාළ ආචාර ධර්ම පද්ධතියක් මගින් විසඳුම් ලබාදීමට ඇති හැකියාව මෙහිදී වැදගත් වේ

එනම්,

©JMC vLearning

- වෙළඳ ලකුණ, ප්‍රකාශන අයිතිය, ස්වාධිකාරය හෙවත් පේටන්ට් අයිතිය වංචනික ලෙස යොදා ගැනීම
- සේවක දක්ෂතා යටපත් කිරීම
- ව්‍යාපාර පිළිබඳ රහස් තොරතුරු ලබා දීම සඳහා චර පුරුෂ සේවය පවත්වා ගෙන යාම වැනි විෂමචාර වළක්වා ගැනීමට අදාළ ආචාර ධර්ම ඉවහල් වේ.

## ව්‍යාපාර ආචාර ධර්මවලට පටහැනිව කටයුතු කරන අවස්ථා

❖ තරගකාරී ව්‍යාපාරවල තොරතුරු සොරා ගැනීම

❖ ව්‍යාපාරික රහස් සොරා ගැනීම

❖ සේවක අයිතීන් සොරා ගැනීම හා සේවක දක්ෂතා යටපත් කිරීම

❖ තරඟකරුවන්ගේ සේවකයන්ට අල්ලස් දීම

❖ දුරකතන පණිවිඩ වලට රහසින් සවන් දීම

❖ නොමග යවනසුළු පණිවිඩ නිකුත් කිරීම

©JMC vLearning

❖ වැරදි තොරතුරු ලබා දීම
❖ සමාගමේ දේපළ හා ලාභ කළමනාකරුවන් ප්‍රයෝජනයට ගැනීම
❖ ඉන්වොයිස් මිල වෙනස් කොට මුදල් වංචා කිරීම
❖ රහස් තොරතුරු බාහිර පාර්ශවයන්ට විකුණා මුදල් ලබා ගැනීම.

©JMC vLearning

## ව්‍යාපාරයන්හි සමාජ වගකීම

- සමාජය තුල ධනාත්මක බලපෑමක් ජනිත කිරීමට, ව්‍යාපාර ක්‍රියාවලිය කළමනාකරණය කිරීම වේ.

මාලන් බේකර්

- සිය ව්‍යාපාර ක්‍රියාකාරකම් පිලිබඳවත් එමඟින් ව්‍යාපාරයට ඇතිවන බලපෑම පිළිබඳවත් පෞද්ගලිකවම ව්‍යාපාර විසින් වගකීමට බැඳීමය

ඇමරිකා එක්සත් ජනපදය

- ව්‍යාපාර විසින් සමාජයට ආපසු දෙන දෑ සමාජ වගකීමයි.

පිලිපීනය

- අද අවශ්‍යව ඇත්තේ සමාජ වගකීම පිළිබඳව තවත් කතා කිරීම නොව එහිලා යමක් කර පෙන්වීමයි. එසේම වඩාත් ස්ථාවර, සෞඛ්‍ය සම්පන්න සශ්‍රීක ලෝකයක් ළඟාකර ගැනීම සඳහා සෑම රටකම ව්‍යාපාර කොටස්කරුවන් විය යුතුයි

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සමාජ වගකීම පිළිබඳ ඉදිරිපත් කරන අදහස

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව ව්‍යාපාරවල සමාජ වගකීම ලෙස ප්‍රමුඛතාව දිය යුතු අංශ

- මානව අයිතීන් (Human Rights)
- සේවක අයිතීන් (Employee Rights)
- පරිසර ආරක්ෂාව (EnvironmentAl Protection)
- ප්‍රජා සේවා (Community Involvement).

## සමාජ වගකීම් ක්ෂේත්‍ර / සමාජ වගකීම පිළිබඳ වර්තමාන දෘෂ්ඨියෙහි අන්තර්ගතය

1. පරිසරය (Environment) කෙරෙහි ව්‍යාපාරවල සමාජ වගකීම

ස්වාභාවික පරිසරය ආරක්ෂා කිරීම සඳහා ව්‍යාපාර සතු වගකීම වේ. එනම් පරිසර හානි අවම වන පරිදිත්, ස්වභාවික පරිසර පද්ධති ආරක්ෂා වන පරිදිත් ව්‍යාපාර කටයුතු පවත්වා ගැනීමට ව්‍යාපාර සතු වගකීමයි

©JMC vLearning

වාතය, ජලය, පස, වනාන්තර, ඇතුළු ස්වභාවික පරිසරයට සිදු කරන ඍණාත්මක බලපෑම් අවම කිරීම තහවුරු කළ යුතුය. ව්‍යාපාර කළමණාකරුවන්ගේ වගකීම වන්නේ පරිසර කළමනාකරණය සඳහා විධිමත් උපාය මාර්ග අනුගමනය කිරීමයි.

කාර්මික අපතේ යාම්, ගුවන් යානා සහ මෝටර් රථ දුම තුළින් නොයෙකුත් රසායණික පදාර්ථයන් පරිසරයට එකතු වීම. වාතය, ජලය, පස දූෂණය, පරිසරයේ අස්වාභාවික විපර්යාසයන් ව්‍යාපාර විසින් පාලනය කළ යුතුය

2. පාරිභෝගිකයින් (Consumer) කෙරෙහි ව්‍යාපාරවල සමාජ වගකීම

පාරිභෝගික ආරක්ෂාව හා අයිතිවාසිකම් සුරැකෙන අයුරින් කටයුතු කිරීම සහ ඉහළ ගුණාත්වයෙන් යුත් නිෂ්පාදිත සාධාරණව සැපයීමට කටයුතු කිරීම වේ.

සමාජ වගකීම ඉටු කළ යුතු ප්‍රධානතම පාර්ශවයක් ලෙස පාරිභෝගිකයින් කෙරෙහි වු වගකීම හැඳින්වේ.

ඒ අනුව,

සමාජ වගකීම = පාරිභෝගිකයින් කෙරෙහි වු වගකීම + සමාජය කෙරෙහි වූ වගකීම වේ

©JMC vLearning

ව්‍යාපාර තුළ පාරිභෝගික කටයුතු පිළිබඳ වෙනමම දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කර පාරිභෝගිකයින් වෙත අවශ්‍ය තොරතුරු සැපයීම, උපදෙස් ලබා දීම. ආරක්ෂාව ලබා දීම කල යුතුය

පාරිභෝගික අයිතීන් හා ඇල්ම පිළිබඳ සැලකිළිමත් වී පාරිභෝගිකවාදය (Consumerism) තහවුරු කළ යුතුය. ජාත්‍යන්තරව පිළිගන්නා පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම මෙහි මූලික හරයයි.

**පාරිභෝගිකයින් කෙරෙහි වු වගකීම ඉටු කිරීම වෙනුවෙන් ව්‍යාපාරවල දායකත්වය**

- භාණ්ඩ හා සේවා පිළිබඳ නිවැරදි තොරතුරු ලබා දීම
- ගුණාත්මක භාණ්ඩ හා සේවා සාධාරණ මිලට සැපයීම
- පාරිභෝගික ගිවිසුම් ආරක්ෂා කිරීම සහ පොරොන්දු ඉටු කිරීම
- ආරක්ෂිත නිෂ්පාදිත සැපයීම
- රජය සම්මත කර ඇති පාරිභෝගික අණ පනත් හා රෙගුලාසි සුරැකීම/නීති රීති හා රෙගුලාසි වලට අනුව කටයුතු කිරීම
- ගණුදෙනුකරුවන්ට අවශ්‍ය විවිධ පහසුකම් සැපයීම.

©JMC vLearning

3. සේවකයින් (Employees) කෙරෙහි ව්‍යාපාරවල සමාජ වගකීම

සේවකයින්ගේ වෘත්තීය සුරක්ෂිතභාවය, සෞඛ්‍ය මෙන්ම සමානාත්මතාවය සුරැකෙන ලෙස ව්‍යාපාර කටයුතු පවත්වා ගැනීම සඳහා වූ බැඳියාවයි

**සේවකයින් කෙරෙහි වු වගකීම ඉටු කිරීම වෙනුවෙන් ව්‍යාපාරවල දායකත්වය**

- සේව්‍ය සේවක සබඳතා වර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම
- සේවකයින් ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා කැපවීම
- සේවකයින්ගේ ආකල්ප ධනාත්මක වන අයුරින් ව්‍යාපාර කටයුතු මෙහෙයවීම
- සේවකයින්ගේ පෞද්ගලික අරමුණු කෙරෙහි අවධානය යොමු කිරීම
- රැකියා සුරක්ෂිතභාවය ඇති කිරීම
- රැකියාවන්හි සමානාත්මභාවය ආරක්ෂා කිරීම
- වෘත්තීය ආරක්ෂාව මෙන්ම මනා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් ඇති කිරීම
- අනතුරු හෝ වෘත්තීය රෝගවලට ගොදුරු වුවහොත් ඒවාට වන්දි ලබා දීම
- අවදානම් ආවරණය සඳහා රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

4. ආයෝජකයින් (Investors) කෙරෙහි ව්‍යාපාරවල සමාජ වගකීම

ව්‍යාපාරය සඳහා අරමුදල් යොදවන අයිතිකරුවන් මෙන්ම කොටස්කරුවන්ගේ හා වෙනත් පාර්ශවවල අරමුදල් සඳහා සාධාරණ ඉපැයීමක් ලබා දීමටත් වෙනත් ආර්ථික ප්‍රතිලාභ ලබා දීමටත් වූ බැඳියාවයි.

අයිතිකරුවන්/ආයෝජකයින් කෙරෙහි වු වගකීම ඉටු කිරීම වෙනුවෙන් ව්‍යාපාරවල දායකත්වය

- ආයෝජිත අරමුදල් හොඳින් කළමනාකරණය කිරීම
- අකාර්යක්ෂමව සම්පත් අනිසි පරිහරණය නොකර සම්පත් කාර්යක්ෂම හා සඵලදායීව උපයෝජනය කිරීමට වග බලා ගැනීම
- ආයෝජිත මුදලට සාධාරණ ඉපැයීමක් ලබා දීම හා විනිවිදභාවය රැකෙන පරිදි කටයුතු කිරීම .

©JMC vLearning

## ඇල්මැති පාර්ශවයන් වෙත සමාජ වගකීම ඉටුවිය යුතු ආකාරය

| ඇල්මැති පාර්ශවය | සමාජ වගකීම |
|---|---|
| අයිතිකරුවෝ/ කොටස්හිමියන් | සාධාරණ ඉපැයීම, විනිවිදභාවය රැකෙන පරිදි කටයුතු කිරීම, යෙදූ සම්පත් ආරක්‍ෂා කිරීම, අවංකව කළමනාකරණ කටයුතු කිරීම |
| සේවකයෝ | සාධාරණ වේතන, වෘත්තීයමය ආරක්‍ෂාව, සමානාත්මතාවය, මනා වෘත්තීය සබඳතා, සෞඛ්‍ය සබඳතා |
| පාරිභෝගිකයෝ / ගනුදෙනුකර | සාධාරණ මිල, ආරක්‍ෂිත නිෂ්පාදිත, පාරිභෝගික අයිතීන් ආරක්‍ෂා කිරීම, අලෙවියෙන් පසු සේවා |
| සමාජය | පරිසර දූෂණය අවම කිරීම, පරිසරය සංරක්‍ෂණය කිරීම, ආර්ථික වර්ධනයට දායක වීම |

©JMC vLearning

## ව්‍යාපාර වලට සමාජ වගකීම ඉටු කිරීම මඟින් අත්පත් කර ගත හැකි ප්‍රතිලාභ (වාසි)

- ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා සමාජයෙන් සහය ලැබීම සහ දිගුකාලීන පැවැත්ම තහවුරු වීම
- යහපත් සමාජ පරිසරයක් ගොඩනැගීම නිසා ව්‍යාපාර වලට අවශ්‍ය යෙදවුම් මෙන්ම වෙළඳපොළ ද පහසුවෙන් ලබා ගත හැකි වීම
- සමාජ වගකීම ඉටු කරන බැවින් රජයේ පාලනය අවම වීම
- ව්‍යාපාරයට හිතකර අංශ අතර අන්තර් රැඳියාව වර්ධනය වීම
- කොටස්වල මිල ඉහළ යාම හා අනාගත කොටස් හිමියන්ගේ ආකර්ෂණය ලබා ගත හැකි වීම
- ව්‍යාපාරයේ ප්‍රතිරූපය වර්ධනය වීම
- ව්‍යාපාරයේ කීර්තිනාමය වර්ධනය වීම
- ප්‍රචාරණ වියදම් අවම කළ හැකි වීම.

©JMC vLearning

## සමාජ වගකීම් ඉටු කිරීමේ දී යොදා ගන්නා උපාය මාර්ග

1. වාර්තා කිරීම (Reporting)
   - බොහෝ ආයතන ඔවුන්ගේ තොරතුරු ප්‍රසිද්ධ කිරීම සහ මහජනතාවට යම් යම් ආරාධනා කිරීමේ දී විවිධ මූල්‍ය තොරතුරු ලබා දීම සිදු කරයි. මෙය නෛතික අවශ්‍යතාවයක් ද වේ
2. විනිවිදභාවය (Transparency)
   - එනම් යහපාලනය සඳහා කරන දේ කියන කියන දේ කරන බව ප්‍රකාශ කිරීම වේ
3. මූලධර්ම/ ප්‍රතිපත්ති (Principles)
   - එනම් තම ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී පිළිගත් ප්‍රතිපත්ති රාමුවක යෙදෙමින් කලයුතු දේ නොකළ යුතු දේ පිළිබඳ කල්තියා තීරණය කිරීම වේ
4. සංකේත (Codes)
   - මෙමඟින් තොරතුරු ලබා දීම, ආයතනයේ උසස් බව, අන් අයට ගරු කිරීම වැනි දේ පිළිබිඹු කිරීම සිදු වේ

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

5. වගවීම (Accountability)

- එනම් තමන් කරන කටයුතු සඳහා වගකීම බාර ගැනීමට ඇති බැඳීමයි විශේෂයෙන් කළමණාකරුවන් වගකීම පිළිබඳ වගවීම සිදු කරයි

6. සත්‍යාපනය (Verification)

- තම කටයුතු පිළිබඳ සොයා බැලීම තුළින් ඒවා විමර්ෂණයට භාජනය කිරීම වේ.

©JMC vLearning

## තිරසාර සංවර්ධනය (Sustainable Development)

තිරසාර සංවර්ධනය යනු, අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය උල්ලංඝනය නොකරමින් වර්තමාන අවශ්‍යතා ලඟා කර ගන්නා වූ සංවර්ධනයයි

## තිරසාර සංවර්ධනය වෙනුවෙන් ලෝක ප්‍රජාවගේ දායකත්වය

### මිහිකත සුමුළුව

පාරිසරික සංවර්ධනය සඳහා වූ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCED/ United Nations Conference on Environment & Development) මිහිකත සුමුළුව ලෙස කෙටියෙන් හැඳින්වේ

මෙය Rio Summit, Rio Conference, යන නම් වලින් ද හඳුන්වයි. කාර්මික රටවල අධි තාක්ෂණ කර්මාන්ත නිසා සිදුවන පරිසර දූෂණය එනම් හරිත වායු බලපෑම (Green House Gas Effect) ලොව පුරා විසිරී පවත්නා පරිසර ගැටළුවක් බවට පත් ව ඇත. මෙම ගැටළුව අවම කර ගැනීම උදෙසා මූලිකව ක්‍රියා කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධිත ආයතනයක් ලෙස මෙම ආයතනය පිහිටුවන ලදී.

©JMC vLearning

### මිහිකත සමුළුව හෙවත් පාරිසරික සංවර්ධනය සඳහා වූ එක්සත් ජාතීන්ගේ සම්මේලනය  සාකච්ඡා කළ කරුණු

- වේගයෙන් වර්ධනය වන ලෝක ජල හිඟය
- රථවාහන වලින් සිදු වන වායු දූෂනය
- ගෝලීය දේශගුණය වෙනස් කිරීමට හේතු වන පාෂාණ භූත ඉන්ධන අවම කිරීම හා විකල්ප බල ශක්ති ප්‍රභව කෙරේ යොමු වීම
- පෙට්‍රෝලියම් වල ඇති ඊයම් අවම කිරීම.

### කියෝතෝ සම්මුතිය

පුද්ගලයින්ට අයත් ස්වාභාවික දේශයක පරිසරය කෙලසන හෝ සංස්කෘතික වශයෙන් නුසුදුසු කිසිදු කටයුත්තක් පවත්වාගෙන නොයන බවට මිහිකත සමුළුවට අයත් සාමාජික රටවල් අතර ඇති කරගන්නා ලද ගිවිසුමයි

©JMC vLearning

### කියෝතෝ සම්මුතියට අදාල එගඟතාවයන්

- යම් භූමියක පරිසර දූෂණය කරන කටයුතු නොකිරීම
- රටක සංස්කෘතිය විනාශ කරන කිසිදු කටයුත්තකට අත්සන් නොකිරීම
- ජෛව විවිධත්වය විනාශ කරන කිසිදු කටයුත්තකට අත්සන් නොකිරීම
- ස්වාභාවික පරිසර කළාප විනාශ වන ආකාරයට සිදු කරනු ලබන මුදල් උපයන කටයුතු අවම කිරීම.




©JMC vLearning